

# මහා ධම්මපාල ජාතකය

බෝධිසත්ව චරිත කථා—අංක 1.

# මහා ධම්මපාල ජාතකය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස,

"සම්බුද්ධ රාජ පවරං ගුණ සාගරන්තං
මාරාතිරේක පවරං මුනි රාජ තේජං,
ආදිච්ච බන්ධු පවරං කුමුදාකරන්තං
පාදාර වින්ද සුචිරං සිරසා නමාමි.

සද්ධම්ම රාජ මධුරං ඉව කප්ප රුක්ඛං
සංසාර සාගර පාරං තරණාය නාවං,
සද්ධම්ම භානු පවරං තිමිරං විනාසා
සද්ධම්ම රාජ මකුටං සිරසා නමාමි.

සංඝස්ස ලෝක පවරං සුවිපුඤ්ඤ ඛෙත්තං
ඤාණං නිලීන විපුලං වරදක්ඛිණෙය්‍ය
සන්තින්ද්‍රියං ධුතවරං පරමේක සේවියං
සම්බුද්ධ රාජ තනුජං සිරසා නමාමි."

මෙසේ බුද්ධාදී ත්‍රිවිධ රත්නයට මාගේ කායාදී ද්වාරත්‍රයෙන් නමස්කාරකොට **අප මහා බෝධිසත්වයන් වහන්සේ** බෝධි සම්භාරයන් පුරා සසර සැරිසරණ සමයෙහි සිදුවූ උන්වහන්සේගේ **බෝධිසත්ව චරිතයක්** ශ්‍රවනාභිලාෂීන්ගේ චිත්තප්‍රමෝදයට හා ධර්ම ශ්‍රවණානිශංසයටද ඉවහල්වනු පිණිස ජාතක අටුවා කථා ආදියෙහි ආ පරිද්දෙන් මෙහි සංග්‍රහ කරමි
**ඒ මෙසේ දතයුතුයි;—**

ශාක්‍ය කුල තිලකවූ තිලෝගුරු බුදු රජාණන් වහන්සේ කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දිනක උන්වහන්සේ විසිදහසක් රහතන්වහන්සේලා පිරිවරා වීථියෙහි පිඬුපිණිස හැසිරෙනබව **සුද්ධෝදන පිය රජ්ජුරු**වන් අසා සම්බුදුයන්වහන්සේ ප්‍රමුඛ විසිදහසක් රහතන් වහන්සේලාත් කැටුව රජගෙට වැඩමවාගෙණ ගොස් කැඳ අවුළු ආදිය වළඳවා ඉක්බිති බත් වළඳවනතුරු සම්බුදුයන් වහන්සේ හා සුද්ධෝදන රජ්ජුරුවෝත් කථාකරමින් උන්සේක. එකල සුද්ධෝදන **රජතෙමේ**

ස්වාමීනි! නුඹවහන්සේ දුෂ්කරක්‍රියාකරණ අවස්ථාවෙහි එක්දවසක් දහවල් මා වැදහොව නිදනකල දෙවිඳුවක් මා සම්පයට පැමිණ කියන්නී සිද්ධාර්ථකුමාරයෝ දුෂ්කරක්‍රියාභූමියෙහි මළෝය'යි කීවාය. එබසට සිද්ධාර්ථකුමාරයෝ බුදුව කාලක්‍රියාකළෝද නුබුදුව කාලක්‍රියාකළෝදැයි විචාළෙමි නුබුදුව කාලක්‍රියා කළෝය'යි දෙව්දූ කීකියාව අසා එසේවීහම් බුද්ධත්වයට නොපැමිණවීතා කාලක්‍රියා නොකෙරෙති. එය අදහා නොගනිමි' යි කීය. එවිට සර්වඥයන් වහන්සේ වදාරණසේක් රජ්ජුරුවෙනි මේ ජාතියේ තබා පළමු ධම්මපාල ජාතකයෙහි දිසාපාමොක් ආචාරීන් සමීපයට ශාස්ත්‍රෝද්ග්‍රහණයට ගියගමනේදී පවා මා මළැයි කියා එක් ඇටයක් ගෙනැවිත් දිසාපාමොක් ආචාරීන් තොපට දක්වා සිපිකාල්හින් අදහා නොගත්තාහු වේදැයි වදාළ කල්හි ඒ කෙසේදැයි සුදෙවුන් මහරදුනන් විසින් ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වනු අරභයා මේම ධම්මපාල ජාතකය වදාළසේක.

ඒ කෙසේදයත්;-

යටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ධම්මපාල නම් ගමෙහි ධම්පාල නම් බ්‍රාහ්මණයෙක් වාසය කළේය ඒ ගම සිටිනා ධම්පාල බ්‍රාහමණයා පටන් ඔහුගේ හැඳූසින් ඇතුළුවූ සියලු දෙනාම පොහොයෙන් පොහොයට අටසිල්ද දමස්පතා පන්සිල්ද දස පින්කිරියවතද් රක්ෂාකරන්නාහ. එහෙයින් ඒ ගමටත් බ්‍රාහ්මණකුලයටත් ධම්පාල නම්විය. එසමයෙහි බෝධිසත්වයෝ එගම ධම්පාල බ්‍රාහ්මණයාගේ බිරින්ද කුසපිළිසිඳ ඉපිද වැඩිවිය පැමිණිසේක. ධම්පාල බ්‍රාහ්මණයෝ තමන්ගේ පුතනුවන්වූ ධම්පාල කුමාරයන් ශාස්ත්‍රෝද්ග්‍රහණය පිණිස දිසාපාමොක් ආචාරීන් සමීපයට යවන්නාහු මසුරන් දහසක්බැඳි පියල්ලකුත් සමග යවූහ.

ධම්පාල කුමාරයෝ තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් සමීපයටගොස් දහසින් බැඳිපියල්ලදී ශිල්පඋගන්නා හැමැත්තෝ පන්සියයක් අතවැස්සන්ට තුමූ ආචාරි වත නියාවට ශාස්ත්‍ර උගන්නාහ එසමයෙහි දිසාපාමොක්ආචාරීන්ගේ පුතනුකෙනෙක් මළහ උන් මළ ශොකයෙන් දිසාපාමොක් ආචාරීන් හා පන්සියයක් අතවැස්සන් ආදිවූ අයද අඬා වැලප ආදාහනකොට ඉක්බිති අතවැස්සන් එක්ව හිඳිමින් ආචාරීන් වහන්සේගේ බාල තරුණවූ පුත්‍රයා මළේය යනාදීන් කිය කියා කථාකරමින් හුන් තැනට ධම්පාලකුමාරයෝ පැමිණ කියන්නාහු බාල මනුෂ්‍යයෙක් මියෙත් ද? ඒ කෙසේවූ දෙයක්දැයි කීහ එවිට සෙසු කුමාරයෝ කියත්

නාහු කිමෙක්ද? ධම්මපාල කුමාරයෙහි මරණයට මේ බාලයාය මේ වැඩිමහල්ලාය කියා වෙනසක් නොමැතිව මරණය සැමටත් සාධාරණව එනනියාය නොදනිදැයි කීහ. එබසට ධම්මපාල කුමාරයෝ කියන්නාහු මරණ පැමිණෙනනියාව දනිමි එහෙත් මේ බාල අවස්ථාවෙහි අපගේ කුලවල මියන්නෝ නැතැයි කීහ. මෙපවත් අතවැසි පන්සියය දිසාපාමොක් ආචාරීන්ට කීහ. දිසාපාමොක් ආචාරීන් එපවත් අසා ධම්මපාල කුමාරයන් ගෙන්වා තොපගේ කුලවල මහලුව විනා බාලඅවස්ථාවෙහි මියන්නෝ නැත්තාහුය යන බස සැබෑදැයි විචාළවිට එසේය ආචාරීන් වහන්ස සැබවයි කීකල්හි එසේවීනම් ඒ පරීක්ෂාකරන්ට වටනේයයි සිතා දිසාපාමොක් ආචාරීතෙම මළාවූ එළුවෙකුගේ ඇටයක් ගෙන්වා ගෙන සෝධා එය පසුම්බියක ලා අනවැස්සෙකුට දී ඔහු හා සමග ධම්පාල කුමාරයාගේ ගමට ගොස් මහළු ධම්මපාල බ්‍රාහ්මණයාගේ නිවස විචාරා එහි පැමිණියේය එවිට ධම්මපාල බ්‍රාහ්මණතෙම ආචාරීන්ට හිඳීමට අසුන් පනවා ආගන්තුක සත්කාරකොට ඉක්බිති දෙදෙනා යහපත් කථාවකින් යුක්තව හුන්හ.

මෙසේ සිටිනා සඳ දිසාපාමොක් ආචාරීන් වහන්සේ ධම්මපාල බ්‍රාහ්මණයන්ට කියන්නාහු තොපගේ පුතනුවෝ යහපත්ව ශිල්ප ශාස්ත්‍රය හා ත්‍රිවේදයත් ඉගෙණඋන් අවස්ථාවෙහි එක්තරා ව්‍යාධියකින් මරු වසහයට ගියාහයි කීහ එවිට **ධම්මපාල** බ්‍රාහ්මණතෙම අතින්අත පැහැර (අත්පුඩිගසා) සිනාසී කියනුයේ අපගේ දරුවෝත් බාල අවස්ථාවෙහි මියෙත්ද? **ඒ නොසෙව්වූ සිධවීමෙක් දැයිකීය.** එවිට දිසාපාමොක්ආචාරියෝම දෙවනුවද **ධම්මපාලයෙනි**, තොපි මා කීවා අදහා නොගනිහුද? මේ තොපගේ පුතනුවන්ගේ ඇටනොවේද? මේ දැකත් අදහා නොගනිහුදැයි විචාළේය. එවිට ධම්මපාල බ්‍රාහ්මණයා මේ එළුවෙකුගේ ඇට හෝ බල්ලෙකුගේ ඇට හෝ වේද, අපගේ දරුවොත් මියෙත්දැයි කීකල ඔහු ඇතුළුවූ උන්ගේ බන්ධු මිත්‍රාදී සියලු දෙනාම සිනාසුනාහ. එකල දිසාපාමොක් ආචාරීතෙම තොපගේ දරුවන් ආදිවූ ඥාතිසමූහයාද බාල කාලයෙහි නොමියන්ට කාරණා කවරේද? **කුමන උපායෙක්ද? කුමන බ්‍රහ්මචරියාවෙක්ද? කුමන කාරණයක් නිසාද?** යන මේ කාරණා විස්තරකොට පහද දුනමැනවයි මතුදක්වන ගාථාවෙන් කීයේය.

1 "කිංතෙ වතං කිංපන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො
අක්ඛාහිමෙ බ්‍රාහ්මණ එතමත්ථං
කස්මාහි තුය්හං දහරා නමීයරෙ"

යනුවෙන් බ්‍රාහ්මණය තොප සමාදන්වන වූ ව්‍රතය කුමක්ද? තොපගේ බ්‍රහ්මචර්‍ය්‍යාව කවරක්ද? මේ විපාකය යහපත්කොට පුරුදු කරණලද කවර කුශල කර්‍මයක්හු ගේද? කවර හේතුවකින් තොපගේ දරුවෝ නොමැරෙත්දැයි යනමේ කාරණ මට කියව එවිට දිසාපාමොක් ආචාරීන්ගේ ප්‍රශ්ණයට උත්තර වශයෙන් දම්පල් බමුණුතෙම මේ මතු දක්වන ගාථා කීයේය.

2 "ධමමං චරාම නමුසා භණාම
පාපානි කම්මානි විවජ්ජයාම
අනරියං පරිවජ්ජෙමු සබ්බං
තසමාහි අම්හං දහරා නමීයරෙ"

අපි දශ කුශල ධර්‍මයෙහි හැසිරෙම්හ. මුසාවාද නොකියම්හ පව් කිරීමෙන් දුරුව වාසය කරම්හ ආර්‍ය්‍යයන් විසින් පිළිකුල් කරණ සියලු පාපිෂ්ට ක්‍රියාවන්ගෙන් දුරුව වාසය කරම්හ. ඒ හේතුවෙන් අපගේ දරුවෝ නොමැරෙත්.

3 "සුණෝම ධමමං අසතං සතංච
නචාපි ධමමං අසතං රොචයාම
හිත්වා අසන්තෙ නජහාම සන්තෙ
තසමාහි අම්හං දහරා නමීයරෙ

අසත්පුරුෂයන්ගේද සත් පුරුෂයන්ගේද ධර්‍ම අසමු අසත් පුරුෂයන්ගේ ධර්‍මය රුචි නොවෙමු. එයෙත් සධර්‍මය කැමති වෙමු. පාපමිත්‍ර සේවනය හැර කල්‍යාණ මිත්‍ර සේවනය කරම්හ. ඒ හේතුවෙන් අපගේ දරුවෝ නොමැරෙත්.

4 "පුබ්බෙව දානා සුමනා භවාම
දදම්පි වෙ අත්ත මනා භවාම
දත්වාපි තෙනානු තප්පාම පච්ඡා
තසමාහි අම්හං දහරා නමීයරෙ"

දන්දීමට පළමුව පිරිසුදු සිත් ඇතිවම්හ. දන්දෙන කාලයෙහිද සතුටු සිත් ඇතිවම්හ දන්දී ඉක්බිතිද පසුතැවිලි නොවන්නෙමු මෙබඳු ආනිශංසයකට පැමිණුනෙමුයි සතුටුවම්හ. ඒ හේතුවෙන් අපගේ දරුවෝ නොමැරෙත්.

5 'සමණෙ මයං බ්‍රාහමණෙපි සොච
වනිබ්බ කෙයාචනකෙ දළිද්දෙද
අන්නෙන පානෙ නාභිතප්ප යාම
තසමාහි අම්හං දහරා නමීයරෙ';

අපි ශ්‍රමණයන්ද බ්‍රාහ්මණයන්ද මාර්ගිකයන්ද පුලන්නන්ද යාචකයන්ද දිළිඳුන්ද ආහාරපානවස්ත්‍රාදියෙන් අනුභව කරවම්හ ඒ හේතුවෙන් අපගේ දරුවෝ නොමැරෙත්.

6 මයංච භරියං නාතික්ක මාම
අම්හෙච භරියා නාතික්ක මන්ති
අඤ්ඤත්‍රතාහි බ්‍රහ්ම චරියං චරාම
තස්මාහි අම්හං දහරා නමීයරේ

අපගේ භාර්‍යාවන් හැර අන්‍ය ස්ත්‍රීන් සමග මෙවුන්දම් සෙවනෙහි නොහැසිරෙමු එසේම අපගේ භාර්‍යාවෝ අප හැර අන්‍ය පුරුෂයන් සමග ගැමිදම්හි නොහැසිරෙති. අපේ භාර්‍යාවන් හැර අන්‍ය ස්ත්‍රීන්කෙරෙහි බ්‍රහ්මචර්යාවෙන් හැසිරෙමු. ඒහේතුවෙන් අපගේ දරුවෝ නොමැරෙත්.

7 "එතාසුච ජායරෙ සුන්ග වාසු
මෙධාවිනො හොන්ති පහූත පඤ්ඤා
බහුස්සුතා වෙද ගුතොච හොන්ති
තස්මාහි අම්හං දහරා නමීයරෙ

අපගේ උත්තම ස්ත්‍රීන්ගෙන් ධාරණශක්තිය ඇත්තාවූ බොහෝ නුවණැත්තාවූ බහු ශ්‍රැතවූ වේදය දන්නාවූ දරුවෝ උපදිති. එහෙයින් අපගේ දරුවෝ නොමැරෙත්.

8 "මාතා පිතා භගිනී භාතරොච
පුත්තාච දාරුච මයංච සබ්බෙ
ධම්මං චරාම පරලොක හෙතු
තස්මාහි අම්හං දහරා නමීයරේ

මව්පියෝද සහෝදර සහෝදරියෝද අඹුදරුවෝද යන අප සියල්ලෝම ධර්මයෙහි හැසිරෙති. එහෙයින් අපගේ දරුවෝ නොමැරෙත්.

9 "දාසාච දස්සා අනුජීවිනොච
පරිචාරකා කම්ම කරාච සබ්බෙ
ධම්මං චරන්ති පරලොක හෙතු
තස්මාහි අම්හං දහරා නමීයරෙ

දාස දාසිහුද සේවකයෝද වැඩකරුවෝද යන මේ සියල්ලෝම පරලොව අභිසිද්ධියට හේතුවූ සුචරිතයෙහි හැසිරෙත් එහෙයින් අපගේ දරුවෝ නොමැරෙති.

10 "ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමා වහාති
එසානි සංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්ම චාරී"

ධර්මයතෙම ඒකාන්තයෙන්ම ධර්මචාරි පුද්ගලයා ආරක්ෂා කරයි මනාකොට පුරුදුකළ ධර්මය තෙම දෙව් මිනිස් සැප හා නිවන් සැපද එලවයි. ධර්මය පුරුදු කළකල්හි ලැබෙන ආනිශංසයනම් මෙය. ධර්මචාරී පුද්ගලතෙම දුගතියකට නොපැමිණෙයි.

11 "ධම්මො හවෙ රක්ඛති ධම්ම චාරිං
ඡත්තං මහන්තං වියවස්ස කාලෙ
ධම්මෙන ගුත්තො මම ධම්මපාලො
අඤ්ඤස්ස අට්ඨීනි සුඛී කුමාරො"

ධර්මයතෙම ඒකාන්තයෙන් ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා ආරක්ෂා කරයි. කෙසේදයත්:- වර්ෂා කාලයෙහි කුඩය නිසා නොතෙමෙන් නාක්මෙනි මාගේ ධම්මපාල කුමාරතෙම ධර්මයෙන් ආරක්ෂා කරන ලද්දේය. මේ ඇට අන්කෙනෙකුගේය කුමාරයා සැපසේ සිටීයයි බ්‍රාහ්මණතෙම කීවේය.

එවිට දිසාපාමොක් ආචාරීතෙම ආගමන ලාභ ලදිමියි සිතා තොපගේ පුත් ධර්මපාල කුමාරයෝ සැපසේ සිටිති. මම තොප විමසනු පිණිස එළු ඇටය ගෙණාවෙමියි කියා ඊට සමාකරවා ගෙණ මේ තොප දවස් යවනා පිළිවෙලයයි පනත ලියවා ගෙන එහි කීපදවසක් නැවතීසිට තමන්වසන තක්සලානුවරට පෙරලා ගොස් ධර්මපාල කුමාරයන් නොතිම් අකුරු කරවා මහත්වූ පෙළ හරින් කුමරුන් නුවරට එව්වේයයි වදාරා මෙ මහා ධම්මපාල ජාතකය දක්වා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. මේ ධර්මය අවසානයෙහි සුදෙවුන් මහරදුනෝ අනාගාමී ඵලයෙහි පිහිටි සේක. එසමයෙහි ධර්මපාල කුමාරයන්ගේ දෙමව්පියෝ මෙසම යෙහි සුඩොදන රජ්ජුරුවන් හා මහමායාදේවීය. එසමයෙහි දිසා පාමොක් ආචාරිහුනම් දැන් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. පන්සියයක් අතවැස්සෝනම් බුදුපිරිසය එසමයෙහි ධර්මපාල කුමාරයෝනම් බුදුවූ මම්ම වෙමියයි තමන්වහන්සේ දක්වා වදළසේක.

මහා ධම්මපාල ජාතකය නිමි.

# ත්‍රිවිධ භවය හෙවත්

## සත්වයන්ගේ ත්‍රිවිධාකාර උත්පත්ති ස්ථාන

කාම භවය, රූප භවය, අරූප භවය යනතුනයි.

මෙකී ත්‍රිවිධ භවයාගේ ආයුප්‍රමාණාදිය මතුදක්වනු ලැබේ.

**කාම භවයනම්**:–පස්කම් පැප විදුවන ස්ථාන 11 කි. එනම්:–

| | | |
|---|---|---|
| මනුෂ්‍යලෝකය, | පරමායුෂ මෙකල හැටියට | අවුරුදු 100 යි |
| චාතුර්මහාරාජිකය, | මනුෂ්‍යලොකගණනින් | අවුරුදු අනූලක්‍ෂය |
| තාවතිංසය: | ,, | තුන්කෝටි හැටලක්‍ෂයයි |
| යාමය, | ,, | දහතරකෝටි හතලිස්ලක්‍ෂයයි |
| තුසිතය, | ,, | පණස්හය්කෝටි හැටලක්‍ෂයයි |
| නිර්මාණරතිය | ,, | දෙසියතිස්කෝටි හතලිස්ලක්‍ෂයයි |
| පරනිර්මිතවසවර්තිය | ,, | නවසියවිසිඑක්කෝටි හැටලක්‍ෂයයි |
| නරකය, | පරමායුෂ | අනන්ත කල්පයක් දක්වයි |
| තිරිසන්ලෝකය | ,, | නියමයක් නැත |
| ප්‍රේත ලෝකය | ,, | ,, |
| අසුර නිකාය | ,, | ,, |

**රූප භවයනම්**:–ධ්‍යාන බලයෙන් ඉපිද පවත්නා ස්ථාන 16 යි

එනම්:–

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | බ්‍රහ්මපාරි සජ්ජය, | පරමායුෂ | කල්පයාගෙන් තුනෙන්පංගුවයි | | |
| 2 | බ්‍රහ්මපුරොහිතය | එම | කල්පයකින් | $\frac{1}{2}$ | යි |
| 3 | මහාබ්‍රහ්මය, | ,, | කල්ප | 1 | යි |
| 4 | පරිත්තාභය | ,, | ,, | 2 | යි |
| 5 | අප්පමාණාභය | ,, | ,, | 4 | යි |
| 6 | ආභස්සරය | ,, | ,, | 8 | යි |
| 7 | පරිත්ත සුභය | ,, | ,, | 16 | යි |
| 8 | අප්පමාණ සුභය | ,, | ,, | 32 | යි |
| 9 | සුභ කිණ්හය | , | ,, | 64 | යි |
| 10 | වේහප්ඵලය | ,, | ,, | 500 | යි |
| 11 | අසඤ්ඤ සත්තය | , | ,, | 500 | යි |
| 12 | අවිහය (සුද්ධාවාස) | ,, | ,, | 1000 | යි |
| 13 | අතප්පය එම | ,, | ,, | 2000 | යි |
| 14 | සුදස්සය එම | ,, | ,, | 4000 | යි |
| 15 | සුදස්සිය එම | ,, | ,, | 8000 | යි |
| 16 | අකනිට්ඨය එම | ,, | ,, | 16000 | යි |

**අරූප භවයනම්.**-රූපයෙහි දොස්දුටු රූපය නැතිකරනු පිණිස අරූප ධ්‍යාන උපදවා ඒ ධ්‍යාන බලයෙන් සතර නාමස්කන්ධයන් පහළව පවත්නා ස්ථාන සතරකි.

එනම්:-

| | | | | |
|---|---|---|---|---|
| 1 | ආකාසානඤ්චායතනය | ආයුෂ කල්ප | 20000 | යි |
| 2 | විඤ්ඤාණඤ්චායතනය | ,, | 40000 | යි |
| 3 | ආකිඤ්චඤ්ඤායතනය | ,, | 60000 | යි |
| 4 | නෙවසඤ්ඤානාසඤ්ඤායතනය | ,, | 84000 | යි |

## සතර අපායනම් කවරහයත්

**1 නරකය**:-කටුක දුක් විඳුවන භයානක ස්ථාන අටයි

එනම්:-

1 සංජීවය, මිනිස්ලොව ආයු ගණනින් අවුරුදු එක්ලක්ෂ සය නවුත දෙදහස් කෝටියකි.
2 කාලසූත්‍රය, දොලොස්ලක්ෂ නව නවුත සය දහස් කෝටියකි
3 සංඝාතය, එක්ප්‍රකෝටි තෙලක්ෂ සැතෙවුත අටදහස් කෝටිය
4 රෞරවය: අටප්‍රකෝටි එකුන් තිස්ලක්ෂ සිවු නවුත සිව් දහස්කෝටියකි.
5 මහාරෞරවය, සැට ප්‍රකෝටි පන්තිස්ලක්ෂ පස්නවුත දෙදහස් කෝටියකි
6 තාපය, පන්සිය තිස් ප්‍රකෝටි සුවාසූ ලක්ෂ එක්නවුත සය දහස් කෝටියකි
7 ප්‍රතාපය, අතුරුකපෙන් බාගයකි (වයස 10 පටන් අසංඛ්‍ය යට ගොස් නැවත බැස 10 දක්වාවූකාලය අන්තඃකල්පයයි
8 අවීචිය, අන්තඃ කල්පයකි

### 2 තිරිසන් අපාය

(පක්ෂි, මත්ස්‍ය මෘගාදී වශයෙන් නොයෙක් තිරිසන් බව ලැබීම) මෙහි ආයුෂ නියම ගණනාවක් කළ නොහැකියි

### 3 ප්‍රේත ලෝකය

(බත් පැන් ආදිය නොලැබීමෙන් අධිකවූ දුඃඛ පීඩාවෙන් ගත වෙන කාලකන්නි සත්ව භාවය ලැබීම) මෙහි සතරකොටසක්වෙත්

1 නිජ්ඣාම තණ්හික, 3 පාංශු පිශාච,
2 ඛුප්පිපාසික, 4 පරදත්තුප ජීවි යනුයි


### 4 අසුර නිකාය

කාලකඤ්ජා නම් ප්‍රෙත අසුර කොට්ස වනාහි කල්ප ගණන් බත්පැන් නොලැබ සැරව කාබීගණ ව්‍යසයකාරන යොදුන් ගණන් උස ඇති දුඃඛිත සවභාවක් ගතකරණ සත්ව කොට්ඨාසයකි.

මෙහි විස්තර විභාගාදිය අප විසින් මතු ලියනු ලබන ග්‍රන්ථයක දක්වනු ලැබේ.

**සි ද්ධි ර ස්තු.**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු